THE SINHALA
ISSN 1834-7061
Aug - 2009



# සිංහල සංස්කෘතික හමුවේ විනෝද රාත්‍රිය

*ආචාර්ය ෂෙල්ටන් පීරිස්*



ආලෙ බැන්ද මාගේ රම්‍යවන්



මොකටද කාසි බාගේ ......



පින් මාලු වලේ ......

එදා 2009 ජූනි 19 වන සිකුරාදා සවස් භාගයේ, නෝත් රොක්ස්හි ඩොන්මුවර් ප්‍රජා ශාලාවේ පැවති, සිංහල සංස්කෘතික හමුව මගින් පළමුවරට සංවිධානය කොට ඉදිරිපත් කළ, විනෝද රාත්‍රියට සහභාගි වීමට, මටද අවස්ථාවක් ලැබුණි. සීතල සොඳුරු රාත්‍රියක් වූ එදින ශාලාව පිරී ඉතිරී යන තරම් රසික රසිකාවියන් ඉතා කුතුහලයෙන් රැස්ව සිටියේ, 'මේ අලුත් වැඩසටහන' කුමක්දැයි බලා ගැනීමටය.

චාරිත්‍රානුකූලව පොල් තෙල් පහන දල්වා ඇරඹුණු මේ සන්ධ්‍යාවේදී, ඉතාමත් සාර්ථක අන්දමින් ඉදිරිපත් කළ සිංහල, දෙමළ හා හින්දි ගීත රැසක්, නැටුම් සමඟින් රස විඳීමට ලැබීම අප ලද භාග්‍යයකි. ඊට අමතරව හාස්‍යජනක කෙටි නාට්‍ය කිහිපයක්ද, මැජික් සංදර්ශනයක්ද, වයලීන් වාදනයන්ද ඊට ඇතුළත් වුණා. අංග ඉදිරිපත් කළ සියළුම කලා කරුවන් මනා පුහුණුවකින් පසු එම අංග ඉදිරිපත් කළ බව මගේ අදහසයි. සිඩ්නි නුවර වෙසෙන අපේම කලාකරුවන් විසින් රසවත් කරන ලද මෙය ප්‍රතිභාපූර්ණ නිර්මාණයක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ. මෙම සන්ධ්‍යාවේ තවත් වැදගත් අංගයක් වූයේ අප හැමගේ ගෞරවාදරයට පත් වූ ෂෙල්ටන් ප්‍රේමරත්න කලා ගුරින් සබයට හඳුන්වා දී, එතුමාගෙන් සිදු වූ සේවය ඇගයීමට ලක් කර සමරුවක් පිළිගැන්වීමයි.

මෙවැනි සංදර්ශනයක් ඉදිරිපත් කිරීම සඳහා ඇප කැප වී, වෙහෙස මහන්සිය නොබලා කටයුතු කළ සිංහල සංස්කෘතික හමුවේ නිලධාරී මඩුල්ලටත්, සහභාගී වූ සියලුම කලා කරුවන්ටත්, ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ස්තුති කිරීම යුතුකමක් බව මම සිතමි. මෙම සංදර්ශනය සඳහා එකම වරදක් ලෙස මා ඇසුවේ එහි කාලය තරමක් කෙටි වූවා නම් හොඳ බවය. කෙසේ වෙත් එය නැරඹීමෙන් ලද ආශ්වාදය ගැන සිතන විට මෙය ඉතාමත් සුළු අඩුවක් බව හැඟේ. රසික රසිකාවියන් පිනවීමට අමතරව මෙහි තවත් ප්‍රධාන අරමුණු දෙකක් තිබී ඇති බව මට දැනගන්නට ලැබුණි. එනම් සංස්කෘතික හමුව මගින් ත්‍රෛමාසිකව පළකරන 'සිංහල' සඟරාවේ පැවැත්ම හා අභිවෘද්ධිය සඳහා අරමුදල් ඇති කිරීම සහ එම ප්‍රසංගයේදී ආහාර විකිණීමෙන් ලැබෙන ආදායම, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය නිසා උන්හිටි තැන් අහිමි වූවන් වෙනුවෙන් ඇති කර ඇති අරමුදලට බැර කිරීමටත්ය.

මෙවැනි සංදර්ශන වාර්ෂිකව පැවැත්වීමට සිංහල සංස්කෘතික හමුවට ධෛර්යය ලැබේවායි පතමි.

*ඡායාරූප: හිමරී අලහේන්ද්‍ර*



කලාගුරින් ෂෙල්ටන්ට සිංහල සංස්කෘතික හමුවේ උපහාරය



නාත් කාදලී - මාත් ආදරෙයි......



මියුරු වයලීන වාදනයක්

**මීලඟ සිංහල සඟරා කලාපය**

සිංහල සඟරාවේ ඔක්තොම්බර් කලාපය ඔක්තෝම්බර් මස පැවැත්වෙන මහා සභා රැස්වීමේදී බෙදා හැරීමට අපේක්ෂා කරමු. ඔබේ ලිපි සහ නිර්මාණ සැප්තැම්බර් 15 වැනිදට පෙර අප වෙත එවන්න. The Editor, SCF, PO Box 2379 , North Parramatta, NSW 2151 . Email – media.scf@gmail.com , editor@thescf.org.au